ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරය - 2024

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරයේ 2024 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, අක්ෂි බැංකු භාරයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අක්ෂි බැංකු භාරය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අක්ෂි බැංකු භාරය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අක්ෂි බැංකු භාරයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අක්ෂි බැංකු භාරයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව අක්ෂි බැංකු භාරයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි අක්ෂි බැංකු භාරය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක බව මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සහ ඊට අදාළ විගණන සාක්ෂි ලබා ගැනීමට අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අක්ෂි බැංකු භාරයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අක්ෂි බැංකු භාරයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අක්ෂි බැංකු භාරයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අක්ෂි බැංකු භාරය ක්‍රියා කර ඇති බව,

- අක්ෂි බැංකු භාරයේ සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, අක්ෂි බැංකු භාරයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් 2011 පෙබරවාරි 24 වන දින සිට කොළඹ ජාතික අක්ෂි රෝහල තුළ ස්ථානගත කරන ලද ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුව 2023 ඔක්තෝබර් 17 දිනැති 2023 අංක 22 දරන ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාර පනත මගින් අන්ධභාවය තුරන් කරලීම සහ වළක්වා ගත හැකි අන්ධභාවය වැළැක්වීමේ සහ පාලනය කිරීමේ අරමුණින් වෙනම ආයතනික ව්‍යුහයක් සහිතව ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරය ස්ථාපිත කර තිබුණි.

එසේ වුවද පනතේ විධිවිධානවලට අනුකූලව 2023 ඔක්තෝබර් 13 දින සිට දෙසැම්බර් 31 දින දක්වා කාලපරිච්ඡේදයට අදාළව ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාරයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණු අතර ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලට අදාළ මූල්‍ය ප්‍රකාශන තුළ එම කාලපරිච්ඡේදයට අදාළ ගනුදෙනු වාර්තා කර තිබුණි. විගණකාධිපති විසින් විගණනය කරන ලද ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවල ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකුවේ 2023 දෙසැම්බර් 31 දිනට පැවති ගිණුම් ශේෂයන් පදනම් කරගෙන සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි.

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 02 අනුව පිළියෙල කළයුතු වුවත් ඊට අනුකූල නොවන ලෙස පිළියෙල කර තිබුණි. විස්තර පහත පරිදි වේ.		
(i) ප්‍රමිතියේ 30 (ආ) ඡේදය ප්‍රකාරව මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වන ශුද්ධ මුදල් ප්‍රවාහය නිශ්චය කිරීම සඳහා ක්ෂය වීම් වැනි මුදල් නොවන අයිතමයන් ගැලපිය යුතු වුවද භාරයේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ආදායම් සහ වියදම් ගිණුමේ සඳහන් රු.5,788,009 ක් වූ වර්ෂයට අදාළ ක්ෂයවීම් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ ගැලපීම් කිරීම වෙනුවට ඉවත් කිරීමට තීරණය කළ වත්කම් වෙනුවෙන් වර්ෂය ආරම්භක දිනය දක්වා වෙන්කර තිබුණු සමුච්චිත ක්ෂය රු.957,095 ක් වර්ෂයට අදාළ ක්ෂය වීම්වලින් ඉවත්කර රු.4,830,914 ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ සමුච්චිත ක්ෂය ලෙස සඳහන් කර ගැලපීම් කර තිබුණි.	ගිණුම් සකසනු ලබන මෘදුකාංගයේ පවතින මෙම දෝෂය 2025 වර්ෂයේ ගිණුම් ප්‍රකාශනවල නිවැරදි කර දැක්වීමට කටයුතු කරන බව.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව.මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කළ යුතුය.

(ii) ප්‍රමිතියේ 31 ඡේදය ප්‍රකාරව එහි සඳහන් කර ඇති කාරණා හැර අස්ථිත්වයක් විසින්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරීත්වයන්ගේ වන දළ මුදල් ලැබීම්වල හා දළ මුදල් ගෙවීම්වල ප්‍රධාන පන්තීන් වෙන වෙනම වාර්තා කළ යුතු වුවද ඊට අනුකූල නොවන ලෙස ක්‍රියාකළ අවස්ථා පහත පරිදි විය.		
• සමාලෝචිත වර්ෂයේදී අක්ෂි බැංකු භාරය විසින් අත්පත්කරගෙන තිබුණු රු.17,400,988 ක් වූ Specular microscope යන්ත්‍රය ලබාගැනීම සඳහා පරිත්‍යාග වශයෙන් ජාතික සෞඛ්‍ය සංවර්ධන අරමුදල් භාරකාර මණ්ඩලය රු.15,000,000 ක් අදාළ සැපයුම්කරුට ගෙවා තිබුණු අතර ගෙවිය යුතු වූ ඉතිරි රු.2,400,988 ක මුදල වර්ෂය අවසාන වනවිට ගෙවිය යුතු වටිනාකමක් ලෙස අක්ෂි බැංකු භාරය විසින් ගිණුම්ගත කර තිබුණි. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂය තුළදී මුදලින් ගණුදෙනුවක් සිදුකර නොතිබියදී මෙම රු.17,400,988 ක් වූ මුදලින් වර්ෂය තුළදී ඉවත් කිරීමට හඳුනාගත් රසායනාගාර උපකරණ පිරිවැය රු.4,552,073 ක් අඩුකර රු.12,848,915 ක් මුදල් ගලායාමක් ලෙස සටහන් කර තිබුණි.	-එම-	-එම-
• සමාලෝචිත වර්ෂයේදී රු.135,936 ක් වූ ලී බඩු හා සවිකිරීම් මිලදීගෙන තිබුණි. තවද වර්ෂය තුළදී පිරිවැය රු.9,074 ක ලී බඩු හා සවිකිරීම් ඉවත් කිරීමේ ගිණුමකට මාරුකර, මිලදී ගත් රු.135,936 ක අගයෙන් මුදල් ප්‍රවාහයක් සිදුනොවන රු.9,074 අඩුකර රු.126,862 ක ශුද්ධ මුදල් ගලායාමක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.	-එම-	-එම-
• සමාලෝචිත වර්ෂයේදී රු.14,200 ක් වූ විද්‍යුත් උපකරණ මිල දී ගෙන තිබුණු අතර පිරිවැය රු.21,247 ක විද්‍යුත් උපකරණ ඉවත්කිරීම් ලෙස වත්කම් ගිණුමෙන් ඉවත්කර තිබුණි. විද්‍යුත් උපකරණ මිල දී ගැනීම මුදල් ගලායාමක් ලෙස සටහන් කිරීම වෙනුවට මෙම අගයට හිලව් කර රු.7,047 ක් ශුද්ධ මුදල් ගලාඒමක් ලෙස දක්වා තිබුණි.	-එම-	-එම-

(iii) පරිගණක උපකරණ රු.113,348 ක් වත්කම් ගිණුමෙන් ඉවත්කර වත්කම් ඉවත්කිරීම් ලෙස වෙනම ගිණුමක සටහන්කර තිබුණු අතර අස්ථිත්වය තුළට මුදල් ගලාඒමකින් තොරව මෙම වටිනාකම මුදල් ගලාඒමක් ලෙස ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.	-එම-	-එම-
(iv) මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනනය වන මුදල් ප්‍රවාහය පිළියෙල කිරීමේදී සමාලෝචිත වර්ෂයේ ලාභය තුළ ඇතුළත් රු.1,161,279 ක් වූ වර්ෂයට අදාළ පොලී ආදායම ඉවත්කර, රු.761,561 ක් වූ වර්ෂයේ මුදලින් ලැබුණු ආදායම මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු වුවද අක්ෂි බැංකු භාරය විසින් සමාලෝචිත වර්ෂයේ සහ ඉකුත් වර්ෂයෙහි ලැබිය යුතු පොලී ආදායමෙහි වෙනස රු.37,366 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළ ගැලපීම පමණක් සිදුකර තිබුණි.	-එම-	-එම-
(v) සමාලෝචිත වර්ෂයේදී මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ රු.40,886 ක්වූ ඉකුත් වර්ෂ සඳහා වූ ගැලපුම් මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි.	පෙර වර්ෂය සඳහා වූ ගැලපුම් රු.40,886 ආරම්භක ශේෂ වෙනස්වීමට පමණක් බලපාන නිසා මෙය මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුළ මූල්‍ය ක්‍රියාකාරකම් යටතේ දක්වා ඇති බව.	-එම-
(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 05 හි 26(අ) ඡේදය අනුව සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට එ.ජ. ඩො. 193,779.32 ක් වන ඉතුරුම් තැන්පතු වටිනාකම වර්ෂයේ අවසන් දිනට විනිමය අනුපාතය වූ රු.293.18 යොදාගනිමින් දේශීය මුදල් ඒකකයට පරිවර්තනය කළ යුතු වුවද ඒ අනුව කටයුතු නොකිරීම හේතුවෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ බැංකු ශේෂය රු.6,477,925 ක් වැඩියෙන් හා සමාලෝචිත වර්ෂයේ අතිරික්තයද එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 05 හි 22 සහ 23 ඡේද ප්‍රකාරව විදේශ මුදලින් කරන ගනුදෙනුවක් ගිණුම් ගත කිරීමේදී මූලික හඳුනා ගැනීම කළ යුත්තේ ගනුදෙනුව සිදු වන දිනට අදාළව පවතින Spot Exchange Rate අනුව නිසා මෙය නිවැරදිව ගිණුම් ගත කර ඇති බව.	අවසන් දිනට පැවති විනිමය අනුපාතය අනුව තැන්පතු වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල වාර්තා කළ යුතුය.
(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 හි 69 ඡේදය ප්‍රකාරව වත්කමක් පාවිච්චි කිරීමට සූදානම් තත්ත්වයට පත් කිරීමෙන් පසුව ක්ෂය කිරීම ආරම්භ කළ යුතු වුව ද භාරය විසින් දේපළ පිරියත හා උපකරණ මිලදීගත් වර්ෂයේදී ක්ෂය නොකිරීම හේතුවෙන්	මෙම මූල්‍ය ප්‍රතිපත්තීන් පවත්වාගෙන යාමට භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබා දී ඇති බව, මෙය මූල්‍ය	ප්‍රමිතියේ අවශ්‍යතාවයට අනුව ගිණුම්කරණ ප්‍රතිපත්තිය වෙනස් කළ යුතුය.

	සමාලෝචිත වර්ෂය තුළදී මිලදී ගෙන භාවිතයට ගෙන තිබුණු රු.601,186 ක්වූ වත්කම්වලට අදාළ රු. 95,052 ක ක්ෂය ගිණුම් ගත කර නොතිබුණි.	ප්‍රකාශනයන් හි ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල හෙළිදරව් කර ඇති බව.	
(ඇ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 7 හි 69 ඡේදය ප්‍රකාරව වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර නැතිනම් අක්‍රියව හෝ ක්‍රියාකාරී භාවිතයෙන් ඉවත් කලද ක්ෂය කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුළ ක්‍රියාකාරී භාවිතයෙන් තොරව පවතින රු.4,695,742 වූ වත්කම් වලට අදාළව සමාලෝචිත වර්ෂය සඳහා වූ රු.957,094 ක ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.	2025 වර්ෂයේ ගිණුම් ප්‍රකාශනවල නිවැරදි කර දැක්වීමට කටයුතු කරන බව.	අක්‍රියව පවතින වත්කම් සඳහා අදාළ ක්ෂය වෙන් කිරීම සිදු කළ යුතුය.

1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2023 අංක 22 දරන ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු භාර පනත			
(i) පනතේ 3 (ඉ) උප වගන්තිය	අක්ෂි ශල්‍ය කර්ම සඳහා අවශ්‍ය වන්නාවූ කුණීත පටක හා වෙනත් පටක ලබා ගැනීමට පටක සම්බන්ධීකරුවන් පුහුණු කළ යුතු වුවද එසේ පුහුණු කිරීම් කටයුතු සඳහා විධිමත් ක්‍රමවේදයක් භාරය විසින් පිළියෙල කර නොතිබුණි.	ඉදිරියේදී නව පටක සම්බන්ධීකාරවරුන් බඳවා ගැනීමේ දී අවශ්‍ය වෙනස් කිරීම් සහිතව පුහුණු කටයුතු කරගෙන යාමට කටයුතු කරන බව.	පනතේ දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii) පනතේ 3 (ඊ) උප වගන්තිය හා 3 (උ) උප වගන්තිය	අක්ෂි ශල්‍ය කර්ම සඳහා අවශ්‍ය වන්නාවූ කුණීත හා වෙනත් පටක බද්ධ කිරීම සඳහා රජයේ රෝහල් වලට නොමිලේ සැපයීමටත් හා අක්ෂි ශල්‍ය කර්ම සඳහා අවශ්‍ය කුණීත පටක හා වෙනත් පටකවල අතිරික්තය වෙනත් රටවලට ලබා දීම සහ ඒ සඳහා නියම කරනු ලැබිය හැකි පිරිසැකසුම් ගාස්තුවක් ඔවුන්ගෙන් අයකර ගැනීමටත් ප්‍රතිපාදන සලසා තිබුණි. මේ සම්බන්ධයෙන් භාරය විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව		

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.		
• පුද්ගලික රෝහල් වෙත කුණීත පටක නොමිලේ සැපයීමට හෝ පිරිසැකසුම් අයකර ලබාදීමට හෝ ප්‍රතිපාදන සලසා නොතිබුණද සමාලෝචිත වර්ෂයේදී කුණීත පටක 143 ක් පෞද්ගලික රෝහල් වෙත ලබා දී තිබුණි.	සියලු දේශීය පුද්ගලික රෝහල් හා විදේශීය රටවල් සඳහා සපයනු ලබන කුණීත පටකවලට පිරිසැකසුම් ගාස්තු අය කරන බව සහ ඒ සඳහා කිසිදු ආකාරයක සීමා කිරීමක් පනතේ සඳහන් කර නොමැති බව.	-එම-
• එක් කුණීත පටකයක් සඳහා පිරිසැකසුම් පිරිවැය රු. 59,977 ක් වුවද භාරය විසින් ශ්‍රී ලංකාවේ පිහිටි පුද්ගලික රෝහල් වෙත එක් කුණීත පටකයක් රු.15,980 ක මුදලකට ලබා දී තිබුණි.	2019 වර්ෂයේදී මුළු පිරිසැකසුම් ගාස්තුව නොව, අක්ෂි පටක ගබඩා කිරීමේ මාධ්‍යයට පමණක් ගාස්තු අය කිරීමට එවකට සිටි සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා තීරණය කළ සහ එහි ගාස්තුව වශයෙන් සලකනු ලැබූයේ කුණීත පටක ගබඩා කිරීමේ මාධ්‍යය සඳහා වන ගාස්තුව බව සහ ඒ අනුව, 2024 වර්ෂයට අදාළ වන කුණීත ගබඩා කිරීමේ මාධ්‍ය සඳහා පිරිවැය වූ රු.15,980 ක් පමණක් අය කළ බව.	-එම-
• පුද්ගලික රෝහල් විසින් කුණීත පටක අවශ්‍යතාවය සහිත පුද්ගලයාට ලබා දීමේදී කුණීත පටකය වෙනුවෙන් අය කරනු ලබන මුදල සම්බන්ධයෙන් නියාමනයක් සිදු කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.	පුද්ගලික රෝහල් විසින් කුණීත පටකය වෙනුවෙන් අය කරනු ලබන මුදල සම්බන්ධයෙන් නියාමනයක් සිදු කිරීම පිළිබඳව අවධානය යොමු කිරීමට පනතින් ප්‍රතිපාදන සම්පාදනය කර නොමැති බව.	පනතේ ප්‍රතිපාදන නොමැතිව කුණීත පටක පුද්ගලික රෝහල් වලට පිරිසැකසුම් පිරිවැයට වඩා අඩු මුදලකට ලබා දෙන බැවින් නියාමනයක් කිරීමට කටයුතු කළ යුතුය.
•		

(iii)	පනතේ 6 (5) උප වගන්තිය	මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයෙකු නොපැමිණීම සඳහා සභාපතිගේ පූර්ව අනුමැතියක් ලබාගැනීමෙන් තොරව සහභාගී වීමට අපොහොසත් වන්නේ නම් එම තුන්වන රැස්වීම අවසානයේදී එකී සාමාජිකයා ස්වකීය ධූරය අත්හරිනු ලැබ ඇති ලෙස සළකනු ලැබිය යුතු වුවද ශ්‍රී ලංකාවේ අක්ෂි වෛද්‍යවරුන්ගේ විද්‍යාලයේ සභාව විසින් නම් කරන ලද නියෝජිතයා සහ ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විසින් නම් කරන ලද නියෝජිතයා පිළිවෙලින් අනුගාමී රැස්වීම් 06ක් හා 04ක් සඳහා සහභාගී වී නොමැති වුවද පනතේ විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි.	මෙම නියෝජිතයින් නුවර සහ ජයවර්ධනපුර රෝහල්වල සේවය කරන බැවින් 2025 වර්ෂයේ සිට zoom තාක්ෂණය ඔස්සේ සම්බන්ධ කරගෙන ඇති බව.	පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(iv)	පනතේ 11 (ඊ) උප වගන්තිය	අක්ෂි ශල්‍ය කර්මය සඳහා අවශ්‍ය වන්නා වූ යම් කුණීත පටක පරිත්‍යාගශීලීන්ගේ නාම ලේඛනයක් සහ දත්ත සමුදායක් සෞඛ්‍ය විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් විමසා තීරණය කරනු ලබන ආකාරයකින් පවත්වාගත යුතු වුවත් නාම ලේඛනයක් පැවතියද දත්ත සමුදායක් (Data Base) පවත්වාගෙන ගොස් නොතිබුණි.	නාම ලේඛනය සමඟ මූලික දත්ත, නම, ලිපිනය, සාමාජිකත්වය ලැබූ දිනය, සාමාජික අංකය පවත්වාගෙන යනු ලබන බව, නමුත් ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී මෙම කරුණු සාකච්ඡාවට භාජනය කර අවශ්‍ය දත්ත සහිතව ලේකම්වරයාගේ අනුමැතිය ද සහිතව දත්ත සමුදායක් පවත්වාගෙන යාමට කටයුතු කරන බව.	-එම-
(v)	පනතේ 11 (ඒ) උප වගන්තිය	අදාළ ප්‍රමිති මත පදනම් වූ කුණීත පටක ලබා ගැනීම සහ බද්ධ කිරීම පිළිබඳ අචාරධර්ම සංග්‍රහයක් සකස් කිරීම අක්ෂි බැංකු භාර මණ්ඩලය විසින් සිදුකළ යුතු වුවත් ආචාර ධර්ම සංග්‍රහයක් සකස් කර නොතිබුණි.	ආචාර ධර්ම පද්ධතියක් සකස් කර නොමැති බව සහ ඉදිරියේදී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සාකච්ඡාවට භාජනය කර විධිමත් ආචාර ධර්ම පද්ධතියක් සකස් කිරීමට කටයුතු කරන බව.	පනතේ විධිවිධාන ප්‍රකාරව ආචාරධර්ම පද්ධතියක් සකස් කළ යුතුය.

(vi)	පනතේ 17 (4) උප වගන්තිය	ආදායම් වියදම් ගිණුම සහ ශේෂපත්‍රය ඒවාට අත්සන් තැබීම සඳහා මණ්ඩලය විසින් සම්මත කළ යෝජනා සම්මතයකින් බලයලත් මණ්ඩලයේ සමාජිකයින් විසින් අත්සන් තබනු ලැබිය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට දැනුම් දී සුදුසු ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන බව.	පනතේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවලට අත්සන් කිරීම සඳහා බලයලත් සාමාජිකයින් පත් කළ යුතුය.
(vii)	පනතේ 19 (1) උප වගන්තිය	අමාත්‍යවරයා විසින් මණ්ඩලය විමසා භාරයේ ප්‍රධාන විධායක අධ්‍යක්ෂකවරයෙකු වියයුතු යම් තැනැත්තෙක් භාරයේ කාර්ය මණ්ඩලයට පත්කරනු ලැබිය යුතු අතර ප්‍රධාන විධායක අධ්‍යක්ෂවරයාට මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වා ඇති සුදුසුකම් සහ පළපුරුද්ද තිබිය යුතුය. එසේ වුවද භාරය සඳහා රීති සකස් කර විධායක අධ්‍යක්ෂවරයෙකු අමාත්‍යවරයා විසින් පත්කර නොතිබුණි.	ප්‍රධාන විධායක අධ්‍යක්ෂ ලෙස කුණිත බද්ධ කිරීම් පිළිබඳ විශේෂඥ සුදුසුකම් සහිත වෛද්‍යවරයෙක් තාවකාලිකව පත්කළ බව සහ ඉදිරියේදී අමාත්‍යවරයාගේ අනුමැතියට යැවීමට කටයුතු කරන බව.	ප්‍රධාන විධායක අධ්‍යක්ෂ ලෙස ස්ථිර පුද්ගලයෙකු අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ පත් කළ යුතුය.
(viii)	පනතේ 20 වගන්තිය	අමාත්‍යවරයා විසින් සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විමසා කුණිත පිළිබඳ අධිශිෂ්‍යත්වයක් ලබා ඇති හෝ බාහිර අක්ෂි රෝග, කුණිත ශල්‍ය කර්ම, කුණිත හෝ බාහිර අක්ෂි රෝග පිළිබඳ පර්යේෂණ හෝ ඉගැන්වීම් පළපුරුද්ද සහිත හෝ කුණිත බද්ධ කිරීම් පිළිබඳව පළපුරුද්ද සහිත වූ විශේෂඥ අක්ෂි වෛද්‍යවරයකු භාරයේ වෛද්‍ය අධ්‍යක්ෂවරයා ලෙස පත් කළයුතු වුවත් ශ්‍රී ලංකා අක්ෂි බැංකුවේ වෛද්‍ය අධ්‍යක්ෂවරයා භාරයේ වෛද්‍ය අධ්‍යක්ෂවරයා ලෙස සේවය කරන අතර අමාත්‍යවරයා විසින් ඔහු එම	භාරය විසින් වෛද්‍ය අධ්‍යක්ෂවරයා යෝජනා කර තාවකාලිකව රාජකාරිය ආවරණය කිරීමට පත් කරන බව සහ ඉදිරියේදී සෞඛ්‍ය අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බව.	ස්ථිර වෛද්‍ය අධ්‍යක්ෂකවරයෙකු අමාත්‍යවරයාගේ අනුමැතිය යටතේ පත් කළ යුතුය.

		තනතුරට පත්කිරීමක් සිදුකර නොතිබුණි.		
(ix)	පනතේ 21 (1) උප වගන්තිය	මණ්ඩලයේ ඉල්ලීම පරිදි, රාජ්‍ය සේවයේ යම් නිලධරයෙකුට, එම නිලධරයාගේ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත සහිතව, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් කාලයක් සඳහා භාරයේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව හෝ ස්ථිරවම පත්කරනු ලැබිය හැකි වුවත් භාරයේ සේවා නියුක්තව සිටින රාජ්‍ය නිලධාරීන් 23 දෙනෙකු සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.	ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු ව්‍යාපෘතියේ සේවය කළ කාර්යය මණ්ඩලයම භාරයේ සේවය කරන බව සහ ඉදිරියේදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කරන බව.	භාරයේ සේවය කරනු ලබන සේවකයින් සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ගත යුතුය.
(x)	පනතේ 27 වගන්තිය (2) (1) (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) හා (ඊ) උප වගන්ති	අමාත්‍යවරයා විසින් මණ්ඩලය විමසා නියෝග සෑදිය යුතු බව දක්වා තිබුණද, අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය වන්නා වූ කුණීත පටක හා වෙනත් පටක එකතු කිරීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය, කුණීත පටක හා වෙනත් පටකවල ගුණාත්මකභාවය, කුණීත පටක ලබා ගැනීමේදී හා බද්ධ කිරීමේදී වෛද්‍ය හා ගුණාත්මක ප්‍රමිති සඳහා ක්‍රියා පටිපාටි, ශ්‍රී ලාංකික ජාතිකයන් නොවන තැනැත්තන්ගෙන් අය කළ යුතු ගාස්තු, වෙනත් රටවල් සමග බෙදා ගැනීමේ දී අනුගමනය කළ යුතු ක්‍රියා පටිපාටිය හා විද්‍යුත් ක්‍රමයෙන් ඉල්ලීම් කිරීම හා සම්බන්ධ කාරණා සම්බන්ධයෙන් එම නියෝග පිළියෙල කර නොතිබුණි.	දැනට නියෝග සකස් කර ක්‍රියාත්මක වෙමින් පවතින බව සහ ඉදිරියේදී අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත්කරන බව.	මේ දක්වා නියෝග සකස් කර ක්‍රියාත්මක වී නොමැති අතර ඒවා කඩිනමින් සකස් කර අනුමැතීන් ලබාගත යුතුය.
(xi)	පනතේ 28 වගන්තිය (2)(1) (අ),(ආ),(ඇ) හා (ඈ) උප වගන්ති	පවරා ඇති බලතලවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි මණ්ඩලය විසින් රීති සෑදිය යුතු බව දක්වා තිබුණ ද	ඉදිරියේදී සකස්කරන බව .	අදාළ රීති කඩිනමින් සකස් කර භාවිතයට ගත යුතුය.

		පටක සම්බන්ධීකරුවන්ගේ සුදුසුකම්, බලතල සහ කර්තව්‍ය, අක්ෂි ශල්‍යකර්ම සඳහා අවශ්‍ය වන්නා වූ කුණීත පටක හා වෙනත් පටක ශ්‍රී ලාංකිකයන්ට ලබාදීමේ ක්‍රියා පටිපාටිය, පටක සම්බන්ධීකරුවන් බඳවාගැනීමේ සහ පුහුණු කිරීමේ ක්‍රියා පටිපාටිය හා පනත යටතේ තබා ගත යුතු සහ පවත්වාගත යුතු නාමලේඛන පවත්වාගෙන යාම සම්බන්ධයෙන් රීති පිළියෙල කර නොතිබුණි.		
(ආ)	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 (2) උප වගන්තිය	මූල්‍ය පාලනය සඳහා සකස්කල අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව සමාලෝචනය ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද භාරය ඒ අනුව කටයුතු කර නොතිබුණි.	භාරය තුළ මානව සම්පත් හිඟයක් පවතින අතර අදාළ තනතුරු අනුමත කර ගත් පසු මෙම කටයුතු සිදු කරනු ලැබේ.	අදාළ පද්ධතියේ සඵලදායීත්වය සමාලෝචනය කර විගණකාධිපති වෙත පිටපතක් ඉදිරිපත් කල යුතුය.
(ඇ)	2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහය හා මෙහෙයුම් අත්පොත			
(i)	මාර්ගෝපදේශ සංග්‍රහයේ 2 පරිච්ඡේදයේ 2.3 ඡේදය	අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සමඟ වාර්ෂික අයවැය ලේඛනයද ඇතුළත් උපාය මාර්ගික සැලැස්මක් සකස් කර එම සැලැස්ම අදාළ රේඛීය අමාත්‍යාංශයේ ලේකම් හරහා, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර නොතිබුණි.	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට ක්‍රියාකාරී සැලැස්ම හා උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමට භාරදී ඇති බව සහ එය අවසන් වූ වහාම රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	අදාල සැලසුම් සකස් කර අනුමැතීන් ලබාගෙන ඒ මත මෙහෙයුම් ක්‍රියාත්මක කළ යුතුය.
(ii)	මෙහෙයුම් අත්පොතේ 3 පරිච්ඡේදයේ 3.1 ඡේදය	සියලුම රාජ්‍ය ව්‍යවසායයන් කාර්ය මණ්ඩලය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් තනතුරු පිහිටුවීමෙන්	මහා භාණ්ඩාගාරයේ අනුමැතිය කඩිනමින් ලබා ගත යුතුය.

			අනතුරුව කාර්ය මණ්ඩලය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බව.	
(iii)	මෙහෙයුම් අත්පොතේ 3 පරිච්ඡේදයේ 3.2 ඡේදය	සේවක සංඛ්‍යාව, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය, වැටුප් ව්‍යුහය සහ දීමනා සම්බන්ධයෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	සේවක සංඛ්‍යාව, බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය, වැටුප් ව්‍යුහය සහ දීමනා සම්බන්ධයෙන් ඉදිරියේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන බව.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු වෙන් අදාළ අනුමැතීන් කඩිනමින් ලබා ගත යුතුය.
(iv)	මෙහෙයුම් අත්පොතේ 3 පරිච්ඡේදයේ 3.3 ඡේදය	එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය හා සංවිධාන සටහන ඇතුළත් උපායමාර්ගික මානව සම්පත් සැලැස්මක් සකස් කර නොතිබුණි.	එක් එක් අංශයේ සේවක අවශ්‍යතාවය හා සංවිධාන සටහන ඇතුළත් උපාය මාර්ගික මානව සම්පත් සැලැස්මක් සකස්කිරීමට කටයුතු කරන බව.	මෙහෙයුම් අත්පොත ප්‍රකාරව උපායමාර්ගික මානව සම්පත් සැලැස්මක් සකස් කළ යුතුය.
(v)	මෙහෙයුම් අත්පොතේ 3 පරිච්ඡේදයේ 3.4 (i) ඡේදය	ආයතනයක් විසින් එහි මානව සම්පත් අවශ්‍යතා නිසි ලෙස හඳුනාගත් බවට සහතික විය යුතු අතර එහිදි පවතින පුරප්පාඩු සහ ඇති කළ යුතු නව තනතුරු සම්බන්ධයෙන් අවධානය යොමු කර එම තනතුරුවලට අදාලව බඳවා ගැනීමේ ක්‍රමවේදය, උපරිම හා අවම වයස් සීමාව, රැකියා විස්තරය අවශ්‍ය අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම් හා රැකියා පළපුරුද්ද හඳුනාගෙන නොතිබුණි.	රාජ්‍ය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් තනතුරු පිහිටුවීමෙන් අනතුරුව මේ සම්බන්ධයෙන් කටයුතු කරන බව . .	මානව සම්පත් අවශ්‍යතා නිසි ලෙස හඳුනාගෙන මෙහෙයුම් අත්පොත ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(vi)	මෙහෙයුම් අත්පොතේ 3 පරිච්ඡේදයේ 3.6 ඡේදය	උපාය මාර්ගික සැලැස්ම, ක්‍රියාකාරී සැලසුම් මත පදනම්ව ඵලදායී කාර්යසාධන ඇගයුම් පද්ධතියක් හඳුන්වා දී නොතිබුණි.	ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයට ක්‍රියාකාරී සැලැස්ම හා උපායමාර්ගික සැලැස්ම සකස් කිරීමට භාරදී ඇති බව,එය අවසන් වූ පසු	සැලසුම් සකස් කිරීම කඩිනමින් සිදු කල යුතුය.

				ඵලදායී කාර්යසාධන ඇගයීමක් හඳුන්වා දෙන බව.	
	(vii)	මෙහෙයුම් අත්පොතේ 7 පරිච්ඡේදයේ 7.5 ඡේදය	භාරය විසින් කාර්තුමය වශයෙන් , අර්ධ වාර්ෂික සහ වාර්ෂිකව කාර්යසාධන වාර්තා පිළියෙල කර, එම වාර්තා අදාළ රේඛීය අමාත්‍යාංශය වෙත සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	දැනට සේවය කරනු ලබන්නේ කළමනාකරණ සහකාරවරු දෙදෙනකු පමණක් බව සහ රාජ්‍ය රාජ්‍ය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් තනතුරු ස්ථාපනය කළ පසු මේ සම්බන්ධයෙන් කටයුතු කරන බව.	කාර්යසාධන වාර්තා පිළියෙල කර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය				
	(i)	VI පරිච්ඡේදය 2.1 වගන්තිය	ස්ථිර වශයෙන්, පරිවාසයට යටත්කොට, ගිවිසුමක් පිට හෝ යම් නිලධරයෙකු තනතුරකට පත්කෙරෙන විට ඒ නිලධරයා වෙනුවෙන් චර්යා සටහන් පත්‍රයක් වහාම පිළියෙළ කළ යුතු වුවත් නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවල චර්යා සටහන් පත්‍ර ඇතුළත් කර නොතිබුණි.	තනතුරු පිහිටුවීමෙන් පසු චර්යා සටහන් පත්‍රයක් භාරයේ නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනුවලට ඇතුළත් කරන බව.	චර්යා සටහන් පත්‍ර පෞද්ගලික ලිපිගොනුවලට ඇතුළත් කළ යුතුය.
	(ii)	XII පරිච්ඡේදයේ 1.7 වගන්තිය	පොදු ආකෘති පත්‍ර 190 ට අනුව අනුමත කරන ලද නිවාඩු පිළිබඳ රෙජිස්ටරයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.	අනුමත කරන ලද නිවාඩු පිළිබඳ රෙජිස්ටරයක් 190 වැනි පොදු ආකෘති පත්‍රය අනුව තබා ගැනීම සම්බන්ධයෙන් ඉදිරියේදී කටයුතු කරන බව.	අනුමත කරන ලද නිවාඩු පිළිබඳ රෙජිස්ටරයක් පවත්වා ගත යුතුය.
(ඉ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				

(i)	මුදල් රෙගුලාසි 135	වියදම් දැරීම සම්බන්ධයෙන් මූල්‍ය බලතල පැවරීමක් සිදු කර නොතිබුණි.	දැනට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පවරන ලද බලතල අනුව ක්‍රියා කරන බව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අදාළ තනතුරු පිහිටුවීමෙන් පසු මෙය නිසි පරිදි සිදු කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වියදම් දැරීම සම්බන්ධයෙන් මූල්‍ය බලතල පැවරිය යුතුය.
(ii)	මුදල් රෙගුලාසි 225	නියමිත ආකෘතිපත්‍රවල නිවැරදි ලෙසත්, සම්පූර්ණ ලෙසත් පුරවා පිළියෙල කරන ලද වවුචර් සියලුම ගෙවීම් සඳහා ඉදිරිපත් කළ යුතු බවත්, කිසියම් ආකෘතිපත්‍ර විශේෂයක් යොදාගත යුතු බවත් නීතියෙන් නියමව ඇති සෑම කල්හි එම ආකෘති පත්‍ර විශේෂයෙන් යොදාගත යුතු බවත් දක්වා තිබුණද වැටුප්, වේතන, අතිකාල, සාමාන්‍ය ගෙවීම්, අග්‍රිම, අත්තිකාරම් හා ගමන් වියදම් ගෙවීම සඳහා පිළිවෙලින් පොදු අකෘති පත්‍ර අංක 33,36,35(අ),35,177/178 භාවිතා කර නොතිබුණි.	වැටුප්, වේතන, අතිකාල, සාමාන්‍ය ගෙවීම්, අග්‍රිම අත්තිකාරම් හා ගමන් වියදම් ගෙවීම් සිදු කිරීම සඳහා භාවිත කරනු ලබන්නේ ශ්‍රී ලංකා ජාතික අක්ෂි රෝහලේ භාවිත කරනු ලබන ආකෘති පත්‍ර බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව පොදු ආකෘති පත්‍ර භාවිතා කළ යුතුය.
(iii)	මුදල් රෙගුලාසි 257	සහතික කළ වවුචර සඳහා පමණක් ගෙවීම් කළ යුතු අතර වවුචර් සහතික කිරීමේ අධිකාරිය ලත් නිලධාරියෙකු විසින් නිසි පරිදි සහතික කොට ඇති බවට වගබලා ගැනීම වවුචර් අනුමත කරන හෝ මුදල් ගෙවන සෑම නිලධාරියෙකුම සතු කාර්යයක් වුවද ගෙවීම් වවුචර් නියැදි පරීක්ෂාවට අනුව අවස්ථා 06 කදී රු.185,370 ක සහතික නොකළ වවුචර් සඳහා ගෙවීම් කර තිබුණි	ප්‍රධාන විධායක අධ්‍යක්ෂ (වැඩ බලන) විසින් සියලුම ගෙවීම් වවුචර සහතික කර ගෙවීම් සඳහා ඉදිරිපත් කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව .	වංචා හා වැරදි සිදුවීම වැළක්වීම සඳහා සියලු ගෙවිම් වවුචර් පත් සහතික කළ යුතුය.
(iv)	මුදල් රෙගුලාසි 260	මුදල් ලබා ගැනීමට ආදායකයා පැමිණියහොත් ගෙවන	ඉදිරියේදී ගෙවීම් කිරීමේදී සියලුම	වවුචර්පත් සඳහා මුදල්

		නිලධාරියා අනන්‍යතාවය සැකහැර දැනගැනීමට වගබලාගත යුතු අතර ආදායකයා වවුචරයේ අත්සන කළ යුතු බව දක්වා තිබුණද ගෙවීම් කිරීමේදී වවුචර්පත්වල මුදල් ලබාගන්නාගේ අත්සන නොමැතිව ගෙවීම් කර තිබුණි.	වවුචර්පත්වල මුදල් ලබාගන්නාගේ නම, අත්සන සහ දිනය ලබා ගෙන ගෙවීම් කිරීමට කටයුතු කරන බව .	ලබාගන්නාගේ අත්සන ලබාගත යුතුය.
(v)	මුදල් රෙගුලාසි 262 (2)	අවස්ථා 51 කදී එකතුව රු.1,139,197 ක් වූ ගෙවීම් වවුචර් හා ඊට අදාල බිල්පත්වල “ගෙවන ලදී”. (Paid) මුද්‍රාව නොමැතිව ගෙවීම් කර තිබුණි.	ඉදිරියේදී නිකුත් කරන සියලුම වවුචර්වල හා එම වවුචරයේ අඩංගු තහවුරු කිරීමේ ලියකියවිලිවල “ගෙවන ලදී”. (Paid) යන මුද්‍රාව තැබීමට කටයුතු කරන බව.	ගෙවීම් වවුචර් හා ඊට අදාළ බිල්පත්වල ගෙවීමෙන් පසු ගෙවන ලදී මුද්‍රාව තැබිය යුතුය.
(vi)	මුදල් රෙගුලාසි 454 (1)	රජයේ දේපළ සහ ගබඩා බඩුවල සෑම ද්‍රව්‍යක්ම බාර ගැනීම හා නිකුත් කිරීම සම්බන්ධයෙන් පොදු 44 ආකෘති පත්‍රයට අනුව කටයුතු කර නොතිබුණි.	අදාළ තනතුරු රාජ්‍ය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ස්ථාපනය කළ පසු මේ සම්බන්ධයෙන් කටයුතු සිදු කරන බව.	ගබඩා ද්‍රව්‍ය බාර ගැනීම සහ නිකුත් කිරීම සඳහා පොදු 44 ආකෘති පත්‍රය භාවිතා කළ යුතුය.
(ඊ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2 ඡේදය	අස්ථිත්වයක් විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කළ යුතු අතර අවම වශයෙන් වසර 03 කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මෙහි ලැයිස්තුගත කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරන බව.	වසර 03 කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුළත් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කළ යුතුය.
(උ)	2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය හා 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/2020 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයෙහි 02 (v) ඡේදය	වැටුප් හා දීමනා තීරණය කළ යුත්තේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අදාළ තනතුරට ලබා දී තිබුණු වැටුප් කේත යටතේ පමණක් වන අතර අමතර ගෙවීම් ලෙස සිදු කරනු ලබන සියලු දීමනා සඳහා මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද	වැටුප් හා දීමනා සම්බන්ධයෙන් රාජ්‍ය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අදාළ තනතුරු පිහිටුවා තීරණය කරන තෙක් ශ්‍රී ලංකා ජාතික අක්ෂි බැංකු ව්‍යාපෘතියේ සේවය කළ කළමනාකරණ සහකාර නිලධාරීන්	වැටුප් හා අමතර ගෙවීම් සඳහා අදාළ අනුමැතීන් ලබා ගත යුතුය.

		ඊට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂයේදී කළමනාකරණ සහකාර නිලධාරීන් දෙදෙනෙකු වෙනුවෙන් වැටුප් සහ දීමනා ලෙස රු.1,645,918 ක් ගෙවීම් කර තිබුණි.	දෙදෙනා භාරයේ සේවය කරනු ලබන බව සහ මේ සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව.	
(ඌ)	2017 අප්‍රේල් 19 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛය	සියළුම රජයේ ආයතනවල ඇඟිලි සලකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතා කිරීම මඟින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබා ගැනීමට පියවර ගත යුතු අතර අතිකාල සහ නිවාඩු දින වැටුප් ආදිය නිත්‍ය රාජකාරි වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් සනාථ කල යුතු නමුත් භාරය ඒ අනුව කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී අතිකාල සහ නිවාඩු දින වැටුප් ලෙස රු.14,841,267 ක් ගෙවීම් සිදු කර තිබුණි.	අක්ෂි බැංකු භාරය ද සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති අනුව යමින් නිසි පරිදි පැමිණීමේ වාර්තා පවත්වා ගනිමින් අදාළ වැටුප් හා අතිකාල දීමනා ගෙවනු ලබන බව.	අතිකාල සහ නිවාඩු දින වැටුප් ලබාගැනීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් කාලය සනාථ කරගත යුතුය.
(එ)	සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම්ගේ 2022 දෙසැම්බර් 22 දිනැති අංක 1822/11 දරන පොදු චක්‍රලේඛ ලිපිය	රැස්වීම්, වැඩමුළු, පුහුණු වැඩ සටහන් ආදියෙහි සම්පත් දායකයින්, සහභාගීවන්නන්, දේශකවරු හා දායකවන අනෙකුත් නිලධාරීන් සඳහා ගෞරව, දෛනික දීමනා හා දේශන ගාස්තු ගෙවීම සම්බන්ධයෙන් චක්‍රලේඛයේ විධිවිධාන අදාල කර ගත නොහැකි වුවද භාරයේ, සෞඛ්‍ය අමාත්‍යාංශයේ හා සෞඛ්‍ය සංවර්ධන අරමුදලේ නිලධාරීන් 26 දෙනෙකු සඳහා ගෞරව දීමනා ලෙස රු.2,780,400 ක් ගෙවා තිබුණි.	මේ සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව.	අමතර දීමනා සඳහා අදාළ අනුමැතීන් ලබාගෙන ගෙවීම් කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 24,454,662 ක අතිරික්තයක් වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචන

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ දී කුණිත පටක 1003 ක් ලැබී ඉන් 907ක් භාවිතයට ගෙන තිබුණු අතර වර්ෂය තුළදී ඉන් කුණිත පටක 96 ක් කල් ඉකුත් වී ඇති බව 2025 දෙසැම්බර් 24 දින විද්‍යුත් තැපැල මගින් විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව නිරීක්ෂණය විය. එසේ වුවද වර්ෂය අවසානයේ දී භාරය තුළ කුණිත පටක 22 ක් ඉතිරිව පැවති බවත් එයට අමතරව කුණිත පටක 6 කල් ඉකුත් වී තිබුණු බවත් තවදුරටත් විගණනයට තොරතුරු ඉදිරිපත් කර තිබුණි. ඉහත සඳහන් පරිදි අවස්ථා දෙකක දී පරස්පර තොරතුරු ඉදිරිපත් කර තිබුණු අතර වර්ෂය තුළදී ලැබීම්, නිකුත් කිරීම්, ඉතිරි තොග සහ කල් ඉකුත් වූ කුණිත පටක සම්බන්ධයෙන් වාර්තා කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි.	ඉදිරියේදී කුණිත පටක සම්බන්ධයෙන් ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයක් භාරය විසින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන බව.	කුණිත පටක ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
කුරුණෑගල සහ නුවර ජාතික රෝහල් වලින් ලබාගන්නා කුණිත පටක එම රෝහල්වල සිට භාරයට රැගෙන ඒමේදී සහ ඒවා බද්ධ කිරීම සඳහා සුදුසු තත්ත්වයේ පවතීදැයි පරීක්ෂා කර කුණිත පටක ඉල්ලුම් කරන ලද රෝහල් වෙත යැවීම සඳහා පොදු ප්‍රවාහන සේවයේ රියදුරු මහතුන් වෙත භාරදී බස්රථ මගින් අදාළ පාර්ශව වෙත යොමු කර තිබුණි. එය ආරක්ෂිත ක්‍රමවේදයක් නොවන බැවින් විධිමත් ක්‍රියාපටිපාටියක් යොදා ගැනීම කෙරෙහි භාරය අවධානය යොමුකර නොතිබුණි.	මේ සඳහා අරක්‍ෂක ක්‍රමවේදයක් හා විධිමත් ක්‍රියා පටිපාටියක් සැකසීමට අධ්‍යක්‍ෂ මණ්ඩලයට ඉදිරියේදී ඉදිරිපත් කරන බව.	ආරක්ෂිත ක්‍රමවේදයක් සකස් කිරීමට කටයුතු කළ යුතුය.

3.3 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
කාර්ය මණ්ඩලය සම්බන්ධයෙන් පවත්වාගෙන යනු ලබන පුද්ගලික ලිපිගොනු විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු සිදුකර නොතිබුණු අතර නිලධාරියන්ගේ අධ්‍යාපන, වෘත්තීය සහ පළපුරුද්ද පිළිබඳව සහතික සහ උප්පැන්න සහතිකවල පිටපත් සහතික කිරීමකින් තොරව ලිපිගොනු තුළ ඇතුළත් කර තිබුණි.	ඉදිරියේදී සකස් කරනු ලබන බව.	ලිපිගොනු විධිමත්ව පවත්වා ගැනීමට කටයුතු කළ යුතුය.

4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොතේ 6 පරිච්ඡේදයේ 6.6 ඡේදය අනුව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන් වී දින 290 ක් ගතවීමෙන් පසු 2025 දෙසැම්බර් 16 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. කෙටුම්පත් වාර්ෂික වාර්තාවද මෙම වාර්තාවේ දිනය දක්වා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් අදාළ තනතුරු පිහිටුවීමෙන් අනතුරුව මෙම කටයුතු නියමිත වේලාවට සිදු කිරීමට කටයුතු කරන බව.	නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

4.2 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) උප වගන්තිය සහ 2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 පරිච්ඡේදයේ 4.4 ඡේදය ප්‍රකාරව අභ්‍යන්තර විගණකවරයෙකු පත් කර නොතිබූ අතර අභ්‍යන්තර විගණන ඒකකයක්ද පිහිටුවා නොතිබුණි.	භාරයේ තනතුරු පිහිටුවා නොමැති බව සහ ඉදිරියේදී තනතුරු පිහිටුවීමේ දී අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවීමට කටයුතු කරන බව.	ජාතික විගණන පනත හා අදාළ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.

4.3 විගණන කමිටුව

විගණන නිරීක්ෂණය	**කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
2021 නොවැම්බර් 16 දින රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ සංග්‍රහයේ 4 පරිච්ඡේදයේ 4.2 (h) ඡේදය ප්‍රකාරව අවම වශයෙන් මාස තුනකට වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතු වුවද භාරය විසින් සමාලෝචිත වර්ෂයේදී රැස්වීම් පවත්වා නොතිබුණි.	ඉදිරියේදී මාස තුනකට වරක් විගණන කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීමට කටයුතු කරන බව.	වර්ෂයක් තුළ නියමිත විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්විය යුතුය.